# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023**

**2026 ජනවාරි/පෙබරවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ සංස්කෘතිය

**(නව නිර්දේශය)**

**බෞද්ධ සංස්කෘතියේ ශ්‍රී ලාංකේය වර්ධනය හා ආසියානු ව්‍යාප්තිය**

**BUCU 38214**

කොටස් දෙකෙන්ම ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

### I කොටස

01. මහින්දාගමනයේ ඓතිහාසිකත්වය පිළිබඳ හැඳින්වීමක් කොට, ලක්රජය හා බෞද්ධාගම අතර පැවති සබඳතාව අනුරාධපුර යුගය ඇසුරින් පැහැදිලි කරන්න.

02. බුදුසමය ජනගත කිරීමෙහිලා ග්‍රන්ථකරණයේ නියැළි ශ්‍රී ලාංකේය භික්ෂූන්ගෙන් ඉටුවූ මෙහෙය අගයන්න.

03. කතිකාවත් පිළිබඳ හැඳින්වීමක් කොට, ශාසනික පරිහානිය වැළැක්වීම සඳහා කතිකාවත් තුළින් සැපයූ පිටුබලය තෝරාගත් කතිකාවතක් ඇසුරින් පෙන්වා දෙන්න.

04. ලන්දේසීන්ගේ ලංකාවතරණය ශ්‍රී ලාංකේය සංස්කෘතියට කෙබඳු බලපෑමක් සිදු කළේදැයි සකාරණ ව පහදන්න.

### II කොටස

05. බුද්ධකාලීන ශාසන ව්‍යාප්තිය සැකෙවින් දක්වා, බුදුසසුනේ ශීඝ්‍ර ව්‍යාප්තියට බලපෑ හේතු සාධක සාකච්ඡා කරන්න.

06. නාලන්දා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අධ්‍යාපන ක්‍රියාපාටිය තුළින් ප්‍රකට කෙරෙන බෞද්ධ අධ්‍යාපනයේ ශ්‍රී විභූතිය පහදන්න.

07. බුදුසමයේ සම්ප්‍රාප්තියෙන් සියම් ජන ජීවිතය හැඩ ගැසුණු අයුරු සනිදර්ශන ව පෙන්වා දෙන්න.

08. ජපානයට බුදුසමය සම්ප්‍රාප්ත වීම පිළිබඳ පසුබිම පහදා, බුදුසමයේ ස්ථාපනය සඳහා උමයාදො කුමරුගෙන් සිදුවූ මෙහෙය ප්‍රමාණ කරන්න.

09. මධ්‍යම ආසියාවේ බුදුසමය පැතිරීම කෙරෙහි බලපෑ හේතු සාධක දක්වා, බෝටානයේ බෞද්ධ සංස්කෘතික පසුබිම මූලාශ්‍රයානුසාරයෙන් පහදන්න.

10. ටිබෙටයෙහි බුදුසමය ස්ථාපිත කිරීමෙහිලා එරට රජවරුන්ගෙන් ලැබුණු දායකත්වය අගයන්න.

******************************